පාර්ලිමේන්තු මාලා අංක-79

ආයතනයේ නම: කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79

ආයතනයේ නම - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුව

පළමු කොටස

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග
01.	2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සියලුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර වාර්තා නොලැබීම හේතුවෙන් ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කිරීමට නොහැකි විය. මෙම ඉඩම් හා ගොඩනැගිලි අතරින් ආයතන 04 ක ඉඩම් හා ගොඩනැගිලි තක්සේරුකර ස්ථාවර වත්කම් මොඩියුලයට ඇතුළත්කර ඇත. ඉතිරි තවත් ආයතන 05 ක පවරා ගැනීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසු තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. තවද අනෙකුත් වත්කම් CIGAS වැඩසටහන් යටතේ ගිණුම්ගත කර යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
02.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2022 වර්ෂයේ සිට අවදානම් ලේඛනය අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වා ගෙන ගොස් ඇති අතර එම ලේඛනය පදනම් කර ගෙන අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබූ බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.
03.	වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	මෙම ගර්හිත වාහනය මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ අංක 43-3028 දරණ ජල බවුසරය වේ. එය 2024.06.12 දින වෙන්දේසි කර ඇති අතර පවරා ගැනීමට අදාළ ලියකියවිලි මොනරාගල දිස්ත්‍රික් ලේකම් වෙත යවා ඇත.
04.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	සිදුවූ වාහන අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 104 (3) මඟින් අදාළ අනතුරු වලින් සිදුවූ හානි සම්බන්ධයෙන් හා ඒවා අයකරගත් ආකාරය පිළිබඳව වාර්තා ඉදිරිපත් කර ඇත. සිදු වූ සියලු අනතුරු සඳහා වූ පූර්ණ හානි මුදල අදාළ රක්ෂණ සමාගම විසින් සම්පූර්ණයෙන්ම පියවා ඇත. ඒ අනුව රජයට කිසිදු අලාභයක් සිදු වී නොමැත. රියදුරන් සඳහා සැලකිලිමත්ව රිය පැදවීම පිළිබඳව දැනුවත් කර ඇත. පොලිස් වාර්තා කැඳවා ඇති අතර එම වාර්තාවට පිළිතුරු නොලද හෙයින් 2024.07.31 වන දින නැවත පොලිස් වාර්තාවක් කැඳවන ලදී. එම වාර්තාවට අනුව දෙපාර්තමේන්තු රියදුරු වගකිවයුතු නිලධාරියකු බවට නම් කළහොත් 104 (4) පරීක්ෂණ ඉදිරියේදී කිරීමට කටයුතු කරන අතර නොඑසේ නම් රජයට අලාභයක් වී නොමැති නම් තවදුරටත් පරීක්ෂණ වාර්තා සිදු කිරීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි.

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග
05.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මේ වන විට 2022 වර්ෂයට අදාළව බැංකු සැසඳුම් වලින් අනාවරණය වූ සියලුම ගැලපුම් කළයුතු ශේෂයන් නිරවුල් කර ඇත. ඉදිරියේදී මෙවැනි ශේෂ ඇති නොවීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ඇති බවද වැඩිදුරටත් දැනුම් දෙමි.
06.	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	ප්‍රධාන කාර්යාලයට අමතරව ලංකාව පුරා වෘත්තීය පුහුණු ආයතන, ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා රැකවරණ නිවාස පිහිටා ඇති අතර එම නිවාස හා ආයතන වල නේවාසිකව සිටින ආබාධිත දරුවන්ගේ ආහාර, බෙහෙත් ද්‍රව්‍ය, හදිසි ප්‍රවාහන කටයුතු වෘත්තීය පුහුණුවීම් වලට අදාළ සියලු කටයුතු හා නේවාසික අවශ්‍යතා යනාදී කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවේ. එම කාර්යන් පවත්වාගෙන යාමේදී අනපේක්ෂිත වියදම් ද දැරීමට සිදුවීම හේතුවෙන් ප්‍රතිපාදන කළමනාකරණය හා බිල්පත් ගෙන්වාගැනීමේදී පාලනය කළ නොහැකි ඇතැම් ගැටලුවලට මුහුණු පෑමට සිදු වූ බැවින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු විය. ඉදිරියේ දී සුදුසු පාලන පියවරක් අනුගමනය කර මෙම තත්ත්වය දැඩි ලෙස පාලනය කිරීමට කටයුතු කරන බව දන්වමි.
07.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙහි සඳහන් හිඟ හිටි ණය ශේෂය සේවය අතහැර ගොස් ඇති එච්.එන්.ආර්.ජේ.පුෂ්ප කුමාර නමැති අයගෙන් අයවිය යුතු රු. 103,420/= ක ආපදා ණය ශේෂයකි. එම ණය ශේෂය අයකර ගැනීමට අදාළව ඔහුට විරුද්ධව නීතිමය පියවර මේ වන විටත් ගෙන ඇති අතර, ඒ සම්බන්ධ මීළඟ නඩුවාරය 2024.08.02 දිනට යෙදී ඇත.
08.	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඇතුළත සමස්තයක් ලෙස පවතිනුයේ කාර්ය මණ්ඩල හිඟයකි. එසේ වුවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා සෘජුව අනුයුක්ත කිරීම හේතුවෙන් සංවර්ධන නිලධාරී තනතුරු වල අතිරික්තයක් පවතී. එනමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1117/V I හා 2017.01.20 දිනැති ලිපිය අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා සමාජ සේවා නිලධාරී තනතුරු 480 ක් අනුමත කර ඇති අතර සමාජ සංවර්ධන සහකාර තනතුරේ නියුතු නිලධරයින් සමාජ සේවා නිලධාරීන් ලෙස බඳවා ගන්නා තෙක් හා දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති සංවර්ධන නිලධාරී තනතුරු 184 අහෝසි වන තෙක් සමාජ සේවා නිලධාරී තනතුරේ පුරප්පාඩු නොපිරවිය යුතු බව දන්වා ඇත. එනමුත් සංවර්ධන නිලධාරී තනතුරු දෙපාර්තමේන්තුමය තනතුරු නොවන අතර අදාළ තනතුරුලාභීන් අවස්ථානුකූලව වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථානමාරු ලබා ගැනීම හේතුවෙන් හා එම නිලධාරීන් වෙනුවට අනුප්‍රාප්තික නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුවට යොමු කිරීම හේතුවෙන් කිසිදු අවස්ථාවකදී සංවර්ධන නිලධාරී තනතුර පුරප්පාඩු වීමක් සිදු නොවීම නිසා සමාජ සේවා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට අවස්ථාව හිමි නොවේ. ඒ අනුව, සමාජ සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරී වෙතින් ද සමාජ සේවා විෂය රාජකාරී ඉටු කරගනු ලබයි. ඒ අනුව, අනුමත කාර්ය මණ්ඩලය තුළ සංවර්ධන නිලධාරී තනතුරු අතිරික්තයක් පැවතිය ද ඔවුන් වෙතින්

		සිදු කරනු ලබන කාර්යභාරය තුළ ඵලදායීව මානව සම්පත ප්‍රයෝජනයට ගෙන ඇත. තවද, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමස්ථ සංවර්ධන නිලධාරී තනතුරු අවශ්‍යතාවය හා අනුමත කරගත යුතු නව තනතුරු පිළිබඳව දක්වමින් ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට දිනයක් හා වේලාවක් ලබාදෙන මෙන් ඉල්ලා මාගේ අංක SSD/02/07/08/01(I) හා 2024.06.25 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇත.

දෙවැනි කොටස

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග
01.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මුදල් අමාත්‍යාංශය මඟින් 2022 අප්‍රේල් 26 දින නිකුත් කරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳව ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුගතව කටයුතු කිරීමට සිදු වූ බැවින් සැලසුම්ගත පුහුණු වැඩසටහන්වලින් සැලකිය යුතු කොටසක් පමණක් වියදම් අවම වන ලෙස කළමනාකරණය කරමින් සිදු කරන ලද බව දන්වමි. ඒ අනුව පුහුණු වැඩසටහන් 25 ක් සැලසුම්කළ අතර ඉන් පුහුණු වැඩසටහන් 15 ක් පවත්වන ලදි.
02.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය	විගණකාධිපති වාර්තාවට අනුව වෘත්තීය පුහුණු ආයතනවල ඉඩම් හා වෘත්තීය පුහුණු ආයතනවලට පරිත්‍යාග වශයෙන් ලැබුණු ඉඩම් තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත නොකිරීම තත්ත්වාගණනය කළ මතයට පදනම් වී ඇත. මෙම දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු ආයතන 11 ක් ස්ථාපිත කර තිබෙන ඉඩම් අතුරින් රාගම හා මාදම්පේ ආයතන වල ඉඩම් වල අයිතිය වෙනත් ආයතන සතු වන අතර පවරා ගැනීම් අවසන් කර ඇති වත්තේගම, කිලිනොච්චිය, තෙළඹුයාය හා මඩකලපුව යන වෘත්තීය පුහුණු ආයතන 4 ට අයත් ඉඩම් හා ගොඩනැගිලි චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් ගත කර ඇත. පුවක්පිටිය ආයතනයේ ඉඩම පවරාගෙන අවසන් කර ඇති අතර තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඉතිරි ඉඩම් 04 ට අයත් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, එම කටයුතු අවසන් වූ පසු තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
03.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු ආයතන 11 ක් ස්ථාපිත කර තිබෙන ඉඩම් අතුරින් රාගම හා මාදම්පේ ආයතන වල ඉඩම් වල අයිතිය වෙනත් ආයතන සතු වන අතර පවරා ගැනීම් අවසන් කර ඇති වත්තේගම, කිලිනොච්චිය, තෙළඹුයාය හා මඩකලපුව යන වෘත්තීය පුහුණු ආයතන 4 ට අයත් ඉඩම් හා ගොඩනැගිලි චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් ගත කර ඇත. පුවක්පිටිය ආයතනයේ ඉඩම පවරාගෙන අවසන් කර ඇති අතර තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඉතිරි ඉඩම් 04 ට අයත් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, එම කටයුතු අවසන් වූ පසු තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. එමෙන්ම සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඇතුළත සමස්තයක් ලෙස පවතිනුයේ කාර්ය මණ්ඩල හිඟයකි. එසේ වුවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නව පත්වීම් ලද

		සංවර්ධන නිලධාරීන් සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා සෘජුව අනුයුක්ත කිරීම හේතුවෙන් සංවර්ධන නිලධාරී තනතුරු වල අතිරික්තයක් පවතී. කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත සංවර්ධන නිලධාරීන් බඳවාගැනීම සිදු කළ බැවින් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පළමු කොටස

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
01.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
02.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සැපයීම සඳහා අභ්‍යන්තර වැඩපිළිවෙලක් ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර ඇත.
03.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සැපයීම සඳහා අභ්‍යන්තර වැඩපිළිවෙලක් ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර ඇත.
04.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානුව තුළ ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර ඇත.
05.	වාහනයක ගර්හිත වී මාස 8 ට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	වාහනයක් ගර්හිත වී මාස 08 කට අඩු කාලයකදී අපහරණය කිරීමට අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රියාවලියක් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.
06.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	වාහන අනතුරු වලට අදාළ මු.රෙ.ප්‍රකාරව කටයුතු අවසන් කර ඇත. මේ වන විට සිදුවන වාහන අනතුරු සම්බන්ධව මු.රෙ. අනුව කටයුතු කරමින් පවතී.
07.	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	සෑම මසකම බැංකු සැසඳුම් ප්‍රකාශය ඊළඟ මස 15 දිනට පූර්වයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
08.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	හඳුනාගත හැකි සියලු ශේෂ මසක් තුළ ගැලපුම් කිරීමට කටයුතු කර ඇත. සුවිශේෂ අවස්ථාවන් හි ඇතැම් ශේෂ හඳුනාගෙන ගැලපීම් කිරීම සඳහා මසකට වැඩි කාලයක් ගතවී ඇත.

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
09.	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට නොඑළඹෙන පරිදි කටයුතු කිරීම සඳහා අභ්‍යන්තර විධිවිධාන සලසා ඇත.
10.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අයවීමට පැවති රු 2,088,528.69 ක ණය ශේෂයෙන් රු 545,782.98 ක ණය ශේෂයක් අය වී ඇත. තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු 1,542,745.71 කි.
11.	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මසක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම මසක් ඇතුළත පියවීමට අභ්‍යන්තර පාලන විධිවිධාන සකස් කර ඇත.
12.	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	2021 හා 2022 වසරවලදී බඳවා ගන්නා ලද උපාධිධාරී සංවර්ධන නිලධාරීන් රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත මෙම දෙපාර්තමේන්තුව වෙත ද අනුයුක්ත කර ඇත. එම නිලධාරීන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

දෙවැනි කොටස

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග
01.	2018.01.24 දිනැති අංක:05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර 2021.03.31 දින අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එහි සඳහන් කාර්යයන් මේ වන විට ඉටු කරමින් පවතී.
02.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා විධිමත් මානව සංවර්ධන සැලැස්ම සෑම වර්ෂයකම සකස් කරනු ලබන අතර ප්‍රකාශිත වර්ෂයේ ද එම සැලැස්ම විධිමත්ව සකස් කර ඇත.
03.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි	වර්ෂයට අදාළව සකස් කරනු ලබන මානව සම්පත් සංවර්ධන සැලැස්ම මගින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් අවම වශයෙන් 50% කට වැඩි පිරිසකට 02/2018 චක්‍රලේඛයෙන් පෙන්වා දී ඇති පරිදි

	පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් ලබාදීමට සැලසුම් කළ ද භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමා කරමින් වරින් වර නිකුත් කරනු ලබන වක්‍රලේඛ හේතුවෙන් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.
04.	සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ත කාර්ය මණ්ඩලය ඇතුළත් කාර්ය සාධන ගිවිසුම් සකස් කරමින් පවතී.
05.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම් කරන ලද පුහුණු සැලැස්ම වරින් වර සංශෝධනය කිරීම සිදුවුව ද සැලසුම්ගත පුහුණු වැඩසටහන් 50% කට වඩා පවත්වන ලදී.
06.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ මතයකි. එම යටත්ව මතයට හේතුවූ කරුණු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
07.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර ඇත.
08.	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ දී සියලු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පළමු කොටස

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
01.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	කළමනාකරණ විගණන වක්‍රලේඛ අංක DMA/01-2019(1) මඟින් අවදානම් ලේඛනය පදනම් කරගෙන අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත. මු.රෙ.133 (ආ) අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කුඩා දෙපාර්තමේන්තුවක් බැවින් දෙපාර්තමේන්තුවෙන් ඉටු කරනු ලබන කටයුතු ආවරණය කරනු ලබන්නේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසිනි. ඒ අනුව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීමේදී දෙපාර්තමේන්තුව ද ආවරණය වන පරිදි අවදානම් ලේඛනය සකස් කිරීම සිදු කරනු ලබයි.

02.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.

දෙවැනි කොටස

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
01.	සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2022 වර්ෂයේ රට තුළ පැවති අර්බුදකාරී තත්ත්වය තුළ සමස්ත කාර්ය මණ්ඩලයටම කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වීම් සම්පූර්ණ කිරීමට නොහැකි වුවද 2023 වර්ෂය සඳහා සමස්ත කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව ඇත. 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/2018 (1) මඟින් ඉදිරි වර්ෂය සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත. (ඇමුණුම 1)
02.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා වර්ෂය මැද පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් නිලධාරීන් රැස් කිරීම ප්‍රායෝගිකව ගැටලු සහගත වූ බැවින් පුහුණු අවස්ථා ලබා දීම අවම කිරීමට සිදු විය. කෙසේ නමුත් 2023 වර්ෂයේදී සියලුම කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පවත්වා ඇත.
03.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	UNCRC දත්ත පද්ධතිය මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබීම නිසා 2022 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් හිමි විය. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව UNCRC දත්ත පද්ධතිය මේ වන විට CIGAS වැඩසටහනට ඇතුළත් කර නිවැරදි කර ඇත. (ඇමුණුම 2)
04.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කමිටු රැස්වීමෙන් අනතුරුව 2023 වර්ෂයේ දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කමිටු රැස්වීම් 2 ක් පැවතිණි. එම රැස්වීම් නියෝග ඇමුණුම 03 පරිදි ක්‍රියාත්මක කර ඇත.
05.	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු සියලු නිලධාරීන්ගෙන් මේ වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.

රනිල් වික්‍රමසිංහ
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය

අමාත්‍යාංශය 01

රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ : 02/2018 (I)

මගේ අංකය : MPA/HRD/ADMIN/Circular/01/2023

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.11.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්

<u>රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම</u>

උක්ත මැයෙන් 2018.01.24 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයට අමතර වශයෙනි.

02. අංක 2289/43 හා 2022/07/22 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය සේවා පුහුණු සම්බන්ධ කාර්යභාරය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුලත් කර ඇත. ඒ අනුව, මහජනතාව වෙත උසස් සේවාවක් සැපයීමේ අරමුණින් සියලු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සැපයීමත්, රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් යන අරමුණු පෙරදැරිව වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව සියළු රාජ්‍ය ආයතනයන්හි දීර්ඝ කාලීන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයත්, එහි වැදගත්කම හා එවැනි සැලැස්මක ඇති ඵලප්‍රයෝජන පිළිබඳවත් නැවත අවධානය යොමුකරමි.

03. රාජ්‍ය සේවයේ සියළුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම සම්බන්ධව පිළිවෙලින් 1998/03/13, 1998/04/30 හා 1998/12/11 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98 (i) හා 08/98 (ii) මඟින් හඳුන්වා දී ඇති කාර්යය සාධන ඇගයීම සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර තවදුරටත් අර්ථපූර්ණ ලෙස යොදාගන්නා ලෙස මින් අවධාරණය කරනු ලැබේ. ඒ අනුව, උක්ත කාර්ය සාධන ඇගයීම වාර්තා මඟින් නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන, එම අවශ්‍යතා සපුරාලීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා එමඟින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා ඔබගේ ආයතනය තුළ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට මෙමඟින් මග පෙන්වනු ලබන අතර ඒ වෙනුවෙන් සකස් කරන ලද මාර්ගෝපදේශය මෙහි උපලේඛනය මඟින් දක්වා ඇත. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය මින් සංශෝධනය කරනු ලබන අතර ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි

[redacted]

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඡේද අංක 02 සිට 06 දක්වා වූ කරුණු තව දුරටත් වලංගු වන අතර එම කරුණු බඩාත් නහවුරු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙහි උපලේඛනයේ ඇතුලත් මාර්ගෝපදේශය මඟින් ලබාදෙනු ලැබේ. ඒ අනුව, ඔබ ආයතනයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමේදී ඒ සඳහා උපයෝගී කරගත හැකිවන පරිදි එහි මෘදු පිටපත මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මානව සම්පත් සංවර්ධන අංශයේ වෙබ් පිටුවෙහි පළකර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලිකර ගැනීම අවශ්‍ය නම් දුරකථන අංක 011 2694041 මඟින් මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය සම්බන්ධ කරගත හැකි බවද සඳහන් කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම් - කරු අ.කා.ස.
02. අග්‍රාමාත්‍ය ලේකම් - කරු අ.කා.ස.
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු අ.කා.ස.
04. විගණකාධිපති - කරු අ.කා.ස.

New CIGAS:-> Asset Report for Final Account for the year

Ledger	Category	Item	Code	Open_Balance	Opn_Bal_Add	TransferIn	Purchase	Disposal	Balance
9151	1.2-Non Residential Building		61112	32,345,000.00	0.00	0.00	0.00	0.00	32,345,000.00
		Office Building	****6111201	32,345,000.00	0.00	0.00	0.00	0.00	32,345,000.00
9152	2.1-Transport Equipment		61121	27,648,000.00	0.00	0.00	0.00	0.00	27,648,000.00
		Passenger vehicle	****6112101	27,648,000.00	0.00	0.00	0.00	0.00	27,648,000.00
9152	2.2-Other Machinary & Equipment		61122	20,763,526.63	0.00	0.00	0.00	0.00	20,763,526.63
		Office Equipment	****6112201	2,272,564.51	0.00	0.00	0.00	0.00	2,272,564.51
		Computer Equipment	****6112202	16,000,747.00	0.00	0.00	0.00	0.00	16,000,747.00
		Electrical Equipment	****6112203	604,238.00	0.00	0.00	0.00	0.00	604,238.00
		Communication Equipment	****6112204	742,224.12	0.00	0.00	0.00	0.00	742,224.12
		Furniture	****6112205	1,137,753.00	0.00	0.00	0.00	0.00	1,137,753.00
		Musical Instruments	****6112206	6,000.00	0.00	0.00	0.00	0.00	6,000.00
9154	5.3 Other Non Finacial-Intangible		61133	2,350,000.00	0.00	0.00	0.00	0.00	2,350,000.00
		Computer Software	****6113301	2,350,000.00	0.00	0.00	0.00	0.00	2,350,000.00
9153	4.1-Land		61410	2,655,000.00	0.00	0.00	0.00	0.00	2,655,000.00
		Land	****614100	2,655,000.00	0.00	0.00	0.00	0.00	2,655,000.00

2023.10.04 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

විස්තරය	2023.10.04 කාරක සභාව ලබා දුන් නියෝගය	වර්තමාන ප්‍රගතිය
2023.07.04 රැස්වීමේ නියෝග අංක 05 අදාල ආයතන සම්බන්ධීකරණය කරමින් UNCRC දත්ත පද්ධතිය ක්‍රියාත්මක කරන දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023 අගෝස්තු 08 දිනට පෙර කාරක සභාව වෙත ලබා දීම.	2021 වර්ෂයේ සිට පැවත එන මෙම ක්‍රියාවලිය නිසිලෙස නිම කිරීමේ ප්‍රමාදය පිළිබඳව සිය අප්‍රසාදය පළ කළ කාරක සභාව මෙම ක්‍රියාවලිය නිම කර ඒ පිළිබඳ වාර්තාවක් 2023.11.04 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කළේය.	අංක PCC/2/2/10 හා 2023.11.03 දිනැති ලිපිය මඟින්අදාල වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. 2023.10.30 දින Open mind Solutions (Pvt) Ltd ආයතනය සමඟ දත්ත පද්ධතිය ස්ථාපනය (Host) කිරීම සඳහා ගිවිසුම්ගතව ඇත. ළමා අයිතිවාසිකම් සම්මුතිය අනුව ඉදිරිපත් කළ යුතු කාලාන්තර වාර්තාව සකස් කිරීමේදී තොරතුරු ඉදිරිපත් කළ යුතු සියලුම ආයතනවල අදාල නිලධාරීන් වෙත දත්ත ඇතුලත් කිරීම සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දී ඇත. දත්ත ඇතුලත් කිරීමේදී අදාල ආයතන විසින් මුහුණ දුන් ප්‍රායෝගික හා තාක්ෂණික ගැටළු අධ්‍යයනය කර දත්ත පද්ධතිය සම්බන්ධයෙන් නිර්දේශ හා විසඳුම් ලබා දීමට කමිටුවක් පත් කර ඇති අතර කමිටු වාර්තාව අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.
ජාතික ළමාරක්ෂක අධිකාරියේ ආයතනික දත්ත පද්ධතිය 2023.07.04 රැස්වීමේ නියෝග අංක 10 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ අනෙකුත් ආයතන වන කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය ආදී අදාළ සියලු ආයතනද ඒකාබද්ධ කර ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා විශ්ව විද්‍යාලවල සහායෙන් ජාතික දත්ත පද්ධතියක් ලෙස වැඩිදියුණු කිරීම කඩිනම් කර, (i)ඒ පිළිබඳ වැඩපිළිවෙළ ඇතුලත් මූලික වාර්තාවක් 2023.08.08 දිනට පෙර හා (ii)ඒ පිළිබඳ ක්‍රියාත්මක දින වකවානු සහිත වාර්තාවක් 2023.10.04 දිනට පෙර ඉදිරිපත් කිරීම.	ආයතනික දත්ත පද්ධතිය ජාතික දත්ත පද්ධතියක් ලෙස වැඩිදියුණු කර පවත්වා නොගැනීම මේ වන තුරු සිදු කර නොතිබීම කාරක සභාවේ අප්‍රසාදයට ලක් විය. 2023.10.04 දිනට පෙර ඉදිරිපත් කිරීමට නියෝග කර ඇති වාර්තාව කඩිනමින් ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.	අංක PCC/2/2/10 හා 2023.11.03 දිනැති ලිපිය මඟින් අදාල වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මේ සම්බන්ධව කටයුතු සිදු කරමින් සිටී.
2023.07.04 රැස්වීමේ නියෝග අංක 07-iii ළමුන් සම්බන්ධ කුලවද්දා ගැනීමේ ආඥා පනත ඇතුළු නීති සහ අණපනත් කාලීන අවශ්‍යතාවයට අනුව සංශෝධන කටයුතු කඩිනම් කර අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම	මේ පිළිබඳව අමාත්‍යාංශය විසින් පත් කර ඇති කමිටුවට අදාළ පාර්ශවයන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා මාසයක කාලයක් ඉල්ලා ඇති බව අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ	අදාල වාර්තාව අංක MOJ/L/(1)/124/2022, MOJ/L4/563/2023 හා 2023.10.17 දිනැති ලිපිය මඟින් අධිකරණ අමාත්‍යාංශය විසින් රජයේ ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. අධිකරණ විෂය භාර අමාත්‍යවරයා වෙනස්වීම මත කුලවැද්දුම් ආඥා පනත සංශෝධනය කිරීමට පත් කළ කමිටුව අහෝසි

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා සම්බන්ධ වී කාන්තා, ළමා කටයුතු හා සමාජ සම්බල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳව දින වකවානු සහිතව වාර්තාවක් 2023 අගෝස්තු 08 දිනට පෙර කාරක සභාවට ලබා දීම.	කළේය. මේ සම්බන්ධව පළාත් ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවලින්ද නියෝජනයක් ලබා ගන්නා ලෙස හා අවසාන ප්‍රගතිය පිළිබඳ දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023.11.04 දිනට පෙර කාරක සභාව අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි.වෙත නියෝග කළේය.	වූ අතර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල නියෝජනයද සමඟ අංක MOJ/L4/563/2023 හා 2024.01.29 දිනැති ලිපිය මඟින් නව කමිටුවක් අධිකරණ අමාත්‍යාංශය විසින් පත් කරන ලදී.අධිකරණ අමාත්‍යාංශය මඟින් අංක MOJ/L4/563/2023 හා 2024.06.10 දිනැතිව ඉදිරිපත් කර ඇති සංශෝධිත පනත් කෙටුම්පත සඳහා පළාත් කොමසාරිස්වරුන්ගේ නිර්දේශ 2024.08.31 දිනට පෙර ලබා දෙන ලෙසට දන්වා ඇත.
පළාත් හා දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු පැවැත්වීම.	2023 ඔක්තෝම්බර් 31 දිනට පෙර පළාත් 8හිම මෙහෙයුම් කමිටු පැවැත්විය යුතු බවද එම වාර්තාව පළාත් කොමසාරිස්වරුන් විසින් කාරක සභාවට ලබා දිය යුතු බවද මේ සඳහා දෙපාර්තමේන්තු, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හා ශ්‍රී ලංකා පොලීසියේද නියෝජනයක් සිදු විය යුතු බවද පොදු න්‍යාය පත්‍රයක් සාදා වාර්තා ඒ ඇසි ළඟින් පිළිබඳ ගැටලු වලට ලබා දෙන විසඳුම් සාකච්ඡා කර මේ සඳහා එක් එක් පළාතේ වැඩපිළිවෙළද සඳහන් කරමින් 2023.11.15 දිනට පෙර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාට ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.	අංක PCC/2/2/10 හා 2023.11.15 දිනැති ලිපිය මඟින් අදාල වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. මෙම කමිටු පැවැත්වීමට අදාල න්‍යාය පත්‍රයක් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2018.01.10 දිනැතිව අංක 01/18 චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති අතර ඒ පිළිබඳව පළාත් ලේකම්වරුන් දැනුවත් කර ඇත. රජයේ ගිණුම් කාරක සභා නියෝග අනුව 2023 වර්ෂයේදී පළාත් කමිටු පැවැත්වීමට කටයුතු කර ඇති අතර 2024 වර්ෂයේදී විධිමත් පරිදි කමිටු පැවැත්වීම සඳහා උපදෙස් ලබා දී ඇත.